# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම -2025

## භූගෝල විද්‍යාව

විභාග අංකය / නම : ..........................................................................................................

| 9 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

**I කොටස**

- ❖ **දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.**
- ❖ **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(1) ධවලගිරි කඳු මුදුන පිහිටා ඇත්තේ ........................... කඳු වැටියේ ය.
( අල්තායි / හිමාලයා / යූරල් )

(2) මහවැලි ගංගා ද්‍රෝණියට ලංකාවේ භූමි ප්‍රමාණයෙන් ........................... පමණ අයත් වේ.
( $\frac{1}{6}$ / $\frac{1}{2}$ / $\frac{2}{6}$ )

(3) ශ්‍රී ලංකාවේ අතරමැදි සදාහරිත වනාන්තර ........................... ප්‍රදේශයේ ව්‍යාප්තව පවතී.
( බදුල්ල / සෝමාවතිය / නකල්ස්)

(4) 2025 වන විට ලංකාවේ වැඩිම ජන ඝනත්වය සහිත දිස්ත්‍රික්කය වන්නේ ........................... දිස්ත්‍රික්කය යි.
( කොළඹ / මහනුවර / ගම්පහ )

(5) ප්‍රධාන නගරවලට තදාසන්නව පිහිටා ඇති ප්‍රදේශ ........................... ජනාවාස වේ.
( ග්‍රාමීය/නාගරික / ගැමි නාගරික)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

(6) ලංකාවේ මීටර 30 සිට 300 දක්වා කලාපය අභ්‍යන්තර තැනිතලාව නම් වේ. නි / වැ

(7) යාපනය අර්ධද්වීපය හුණුගල් බහුල කලාපයක් ලෙස සැලකේ. නි / වැ

(8) ජපානය ආසියාවේ අඩු ජනගහනයක් සහිත රටකි. නි / වැ

(9) ජන සංඛ්‍යා වර්ධනය යනු රටක දළ උපත් හා මරණ අනුපාතිය අතර වෙනසයි. නි / වැ

(10) වළාකුළු වනාන්තර ඇත්තේ පහතරට තෙත් කලාපීය වනාන්තර වල ය. නි / වැ

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(11) ආසියාවේ විශාලතම කඩොලාන වනය ............................................... හි පිහිටා ඇත.

(12) පාකිස්ථානයේ ප්‍රධාන වගා කන්න ............................................... ලෙස හඳුන්වයි.

(13) ශ්‍රී ලංකාවට ආවේණික මලක් වූ මහරත් මල ............................................... ප්‍රදේශයේ බහුලව දැකිය හැක.

(14) භූමියේ උස අනුව උෂ්ණත්වය අඩුවීම ............................................... නම් වේ.

(15) පරිසරික කටුක බවින් මිදීමටත්, ආරක්ෂාව සඳහාත් මිනිසුන් ............................................... තනා ගන්නා ලදී.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) සර්ඩේරියා ගංගාව ............................ මුහුදට ගලා බසී.

(i) කැස්පියන් (iii) පැසිපික්

(ii) එරල් (iv) කලු

(17) ශීත දේශගුණික කලාපයට අයත් කඳුකර දේශගුණ වර්ගය දක්නට ඇත්තේ ............................ ආශ්‍රිත ප්‍රදේශවලය.

(i) ජපන් දූපත් (iii) සයිබීරියාව

(ii) මධ්‍යධරණී මුහුද (iv) හිමාලයා කඳු

(18) රක්වාන කඳු හා බුලුතොට හෙල් ............................ ලෙසින් ද හැඳින්විය හැක.

(i) ශේෂ කඳු (iii) මධ්‍ය කඳුකරය

(ii) සමාන්තර හෙල් වැටි (iv) බෑවුම්

(19) වියළි කලාපය හරහා ගලා බසින ගංගා ............................ ගංගා ලෙස ද හඳුන්වයි.

(i) සෘතුමය (iii) ඊසාන දිග

(ii) අරිය (iv) නිත්‍ය

(20) ළුමිතිරි අනුපාතය යනු ............................ 100 කට සිටින පුරුෂ සංඛ්‍යාවයි.

(i) පුරුෂ (iii) ස්ත්‍රීන්

(ii) සිංහල (iv) දරුවන්

( ලකුණු 02 × 20 = 40 )

## II - කොටස

- ❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

---

(1) (අ) ඔබට සපයා ඇති ආසියානු ප්‍රදේශය දැක්වෙන සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




(i) වර්තමානය වනවිට යුධමය තත්ත්වයක් පවතින රටක් වන ඉරානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) යූරල් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) ලොව ගැඹුරුතම මිරිදිය විල ලෙස සැලකෙන බයිකල් විල නිරූපණය කරන අක්ෂරය කුමක් ද?

(iv) ලොව ඉපැරණි ශිෂ්ටාචාරයක් ගොඩ නැගුනු ගංගාවක් දැක්වෙන අක්ෂරය කුමක් ද? (2 x 4 = 8)

(ආ)

(i) 1 : 50 000 හූ ලක්ෂණ සිතියමක හඳුනාගත හැකි භෞතික ලක්ෂණ 01ක් සහ සංස්කෘතික ලක්ෂණ 01 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ලක්ෂණ සඳහා සම්මත සංකේත හා වර්ණ භාවිත කරමින් ඇඳ දක්වන්න.

(a) දිස්ත්‍රික්ක මායිම

(b) පොලිසිය

(c) අඩිපාර

(d) වැව (ලකුණු 1 x 4 = 4)

(iii) ශ්‍රී ලංකාව ආවරණය කිරීම සඳහා 1 : 50 000 හූ ලක්ෂණ සිතියම් පත්‍ර කීයක් නිර්මාණය කර තිබේ ද? (ලකුණු 02)

(2) (i) ආසියානු මහද්වීපයට නැගෙනහිරින් මායිම් වන්නේ කුමන සාගරය ද? (ලකුණු 02)

(ii) ආසියානු ප්‍රදේශයට අයත් ලොව වැඩිම ජන සංඛ්‍යාව වෙසෙන රටවල් 02 නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත සඳහන් ගංගාවලින් ආක්ටික් සාගරයට ගලා බසින ගංගා 02 ක් තෝරා ලියන්න.

c. මීකොං ගංගාව

d. ලීනා ගංගාව

b. ඕබි ගංගාව

d. අමූර් ගංගාව

(ලකුණු 02)

(iv) වරහන තුළ දක්වා ඇති රටවල් පහත දෙන ලද වගුවෙහි නිවැරදි ස්ථානය තුළ ලියා දක්වන්න.
(බංග්ලාදේශය , ජාවා දූපත් , ඉන්දියාව , ඊසාන දිග ඉන්දියාව , සුමාත්‍රා දූපත , නැගෙනහිර චීනය)

| නිවර්තන වර්ෂා දේශගුණය | නිවර්තන සැවනා දේශගුණය |
|---|---|
| (a) ............................................... | (a) ............................................... |
| (b) ............................................... | (b) ............................................... |

(ලකුණු ½ x 4 = 2)

(v) ආසියානු ප්‍රදේශය ලොව අන් ප්‍රදේශවලට වඩා සුවිශේෂී වීමට හේතු 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) (i) ආසියානු කලාපයේ අඩුම උෂ්ණත්වය සහ වැඩිම උෂ්ණත්වය පෙන්වන නගර දෙක අයත් රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) අසියානු කලාපය තුළ දැකිය හැකි ප්‍රධාන දේශගුණික කලාප සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) අරාබි රටවල් , ඉන්දියාව , ශ්‍රී ලංකාව වැනි රටවල දක්නට ලැබෙන ජන වර්ගය කුමක්ද? (ලකුණු 02)

(iv) කේතුධර වනාන්තරවල වැවෙන ශාක වර්ග 02ක් නම් කර ඒවායේ විශේෂ ලක්‍ෂණ 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(4) (i) ආසියාවේ වැඩිම ජන ව්‍යාප්තියක් පවතින කලාප 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) හිමාලයා කඳුකර කලාපය , කාන්තාර , උතුරු දිග තැනිබිම් ප්‍රදේශ ආසියාවේ ජන හීන ප්‍රදේශ වේ. මේ තත්ත්වයට බලපාන හේතු 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) පහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැදගත්වන රටවල් 01 බැගින් සඳහන් කරන්න.

(a) පෙට්‍රෝ රසායන කර්මාන්ත.
(b) අමු කපු නිෂ්පාදනය කිරීම.
(c) ජාත්‍යන්තර සන්නිවේදන සේවා සැපයීම. (ලකුණු 03)

(iv) (අ) ආසියාව කේන්ද්‍ර කරගත් මානව ශිෂ්ඨාචාර 02ක් නම් කරන්න. (ලකුණු 02)
(ආ) ''ජෙබිල් අලි'' වරායේ ඇති වැදගත්කම් 01ක් ලියා දක්වන්න. (ලකුණු 02)

(5) (i) ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ පිහිටි ප්‍රධාන කඳු පන්ති 02ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) (අ) ශේෂ කඳු යනු *මොනවාද?*
(ආ) ශේෂ කඳු 02 කට උදාහරණ ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) පහත දැක්වෙන භූ දර්ශන හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 03)










a ......................  b ......................  c ......................

(iv) ඉහත ඔබ විසින් දක්වන ලද භූ දර්ශන ඇසුරින් සිදුකරන ආර්ථික ක්‍රියාකාරකම් 01 බැගින් සඳහන් කරන්න. (ලකුණු 03)

(6) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න කීයක් පිහිටා තිබේ ද? (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ දේශගුණයේ කැපී පෙනෙන ලක්ෂණ 02 නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත දැක්වෙන ප්‍රකාශය හොඳින් කියවන්න.

> ''ඉදිරි මාස 03ක කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ උතුරු හා උතුරු මැද ප්‍රදේශවලට ලැබෙන වර්ෂාපතනය අඩුවීමේ ප්‍රවණතාවයක් කාලගුණික දත්ත අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන ලෙසට ජනතාවට දැනුම් දෙනු ලැබේ.''

ඉහත ප්‍රකාශයට අනුව ඉදිරියේ දී එම ප්‍රදේශවල නිරීක්ෂණය කළ හැකි වන්නේ,

(අ) කාලගුණික වෙනස්වීමක් ද? දේශගුණික වෙනස්වීමක් ද? (ලකුණු 01)

(ආ) එම තත්ත්වය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 02)

(iv) (අ) ලංකාවේ පහතරට වියළි කලාපය තුළ වැඩි වශයෙන් වැව් ඉදිකිරීමට බලපා ඇති හේතු 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ''පෘථිවිය මත ශ්‍රී ලංකාව සුවිශේෂී ස්ථානයක පිහිටා ඇත'' මෙම පිහිටීම තුළ අපට ඇති වාසි 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(7) (i) පහත දක්වා ඇති රූපයෙන් දැක්වෙන ජනාවාස වර්ගය නම් කරන්න. (ලකුණු 02)



(ii) බස්නාහිර පළාතේ ජන සංඛ්‍යාව වැඩි වීමට බලපානු ලබන හේතු 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සිදුකරන ලද සංවර්ධන ක්‍රියාමාර්ග 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) සංවර්ධන පහසුකම් ඇති කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) වන සතුන්ගේ නිජබිම් අහිමිවීම (අලි මිනීස ගැටුම) ලංකාවේ මේ වනවිට පවතින විශාල ගැටලුවකි. එය අවම කර ගැනීම සඳහා ශිෂ්‍යයෙක් ලෙස ගතහැකි විසඳුම් 01ක් යෝජනා කරන්න. (ලකුණු 02)